සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

11 S I

**පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019**

# First Term Test - Grade 11 - 2019

**නම/විභාග අංකය : ............................................ බුද්ධ ධර්මය - I** **කාලය : පැය 01යි.**

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(01) ගිහි ජනතාව විසින් පැවිදි සමාජයට සිව්පසයෙන් සංග්‍රහ කරනු ලැබේ. එම සව්පස නිවැරදිව අනුපිළිවෙලට දක්වා ඇති වරණය වන්නේ,
(1) පිණ්ඩපාත, චීවර, සේනාසන හා ගිලන්පස ලෙස ය.
(2) ගිලන්පස, චීවර, පිණ්ඩපාත හා සේනාසන ලෙස ය.
(3) සේනාසන, පිණ්ඩපාත චීවර හා ගිලන්පස ලෙස ය.
(4) චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලන් පස ලෙස ය.

(02) බුදුරජාණන් වහනසේට මුහුණදීමට සිදු වූ ප්‍රධානතම අභියෝගය වූයේ දුක් සහිත වූ පංචස්කන්ධය නැති කිරීමයි. එම පංචස්කන්ධය නම්,
(1) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය (2) ඇස, කණ, නාසය, දිව, ශරීරය
(3) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ (4) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස

(03) බුදුරාජාණන් වහන්සේට ද, ධර්මයට ද අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා පිළිවෙලින් කවරහු ද?
(1) බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ. (2) සුප්පිය හා බ්‍රහ්මදත්ත.
(3) සුප්පිය මා ඉසිදත්ත. (4) සුප්පිය හා සෝණදණ්ඩ.

(04) ''මහණෙනි, ඔබට දන් මවෙක් නැත. පියෙක් නැත. එහෙයින් මෙබඳු අවස්ථාවක දී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු යැයි'' බුදුහිමි දේශනා කළේ,
(1) ගිලනුන්ට උපස්ථාන කිරීම තුළිනි. (2) අසරණ සරණ ගුණය තුළිනි.
(3) පුරිසදම්ම සාරථී ගුණය තුළිනි. (4) තාදි ගුණය තුළිනි.

(05) බෝසත් උතුමෝ බුද්ධත්වය පතා පුරණු ලබන උතුම් පිළිවෙත් සමූහය හැඳින්වෙන්නේ,
(1) දස පුණ්‍ය ක්‍රියා නමිනි. (2) දස පාරමිතා නමිනි.
(3) දස සක්විතිවත් නමිනි. (4) දස රාජ ධර්ම නමිනි.

(06) බුදුරජාණන් වහන්සේට ජේතවනාරාමය හා වේළුවනාරාමය යන ආරාමය පූජා කළේ,
(1) බිම්බිසාර රජු හා විශාඛා සිටුදේවිය විසිනි.
(2) විශාඛා සිටුදේවිය හා අනේපිඬු සිටුතුමා විසිනි.
(3) අනේපිඬු සිටුතුමා හා බිම්බිසාර රජතුමා විසිනි.
(4) කොසොල් රජතුමා හා මල්ලිකා දේවිය විසිනි.

(07) බුදුහිමි ලබා දුන් තනතුරු පිළිබඳ අතෘප්තිමත්ව සිටි භික්ෂුව වූයේ,

(1) ආනන්ද තෙරුවන් වහන්සේ ය. (2) සැරියුත් තෙරුන් වහන්සේ ය.

(3) රාහුල තෙරුන් වහන්සේ ය. (4) ඡන්න තෙරුන් වහන්සේ ය.

(08) බෝසතාණන් වහන්සේ දස පෙරුම්දම් පිරූ ආකාරය දැක්වෙන ජාතක කථා අතුරින් ප්‍රඥා පාරමිතාව පිරූ ජාතක කථාව වන්නේ,

(1) ලෝමහංස ජාතකයෙනි. (2) උම්මග්ග ජාතකයෙනි.

(3) මහා කපි ජාතකයෙනි. (4) වට්ටක ජාතකයෙනි.

(09) බාහිර වස්තු පමණක් නොව ශරීරාංග ද පරිත්‍යාග කරමින් පාරමිතා පිරිය යුතු බව පැහැදිලි වන්නේ,

(1) පාරමී තුළිනි. (2) පරමත්ථ පාරමී තුළිනි.

(3) උප පාරමී තුළිනි. (4) අනගාරික ප්‍රතිපදාව තුළිනි.

(10) සිත කිලිටි කරන නිවන් මග අවුරාලන ක්ලේශ ධර්ම පහක් දහමේ ඉගැන්වේ ඒවා නම්,

(1) පංච නීවරණ ධර්ම නම් වේ. (2) පංච ආනන්තරිය කර්ම නම් වේ.

(3) පංච නියාම ධර්ම නම් වේ. (4) පංච සීල නම් වේ.

(11) සුනීත, සෝපාක වැනි අයට පිහිට වීමෙන් බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට වන්නේ,

(1) යථාවාදී තථාකාරී ගුණය ය. (2) අසරණ සරණ ගුණය ය.

(3) පුරිසධම්ම සාරථී ගුණය ය. (4) ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය ය.

(12) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ගණයට ඇතුළත් **නොවන** කරුණක් වන්නේ,

(1) සිහි මුලාවී කලුරිය කිරීමයි.

(2) කීර්තිය පැතිරීමයි.

(3) නිර්භව ඕනෑම පිරිසක් වෙත යා හැකි වීමයි.

(4) මරණින් මතු සුගතියෙන් උපත ලැබීමයි.

(13) බුදු දහමේ දැක්වෙන පරිදි බෞද්ධ අපගේ පරම අපේක්ෂාව වන්නේ,

(1) සිල් රැකීමයි. (2) දානමානාදී පිංකම්වල යෙදීමයි.

(3) නිර්වාණාවබෝධයයි. (4) භාවනානුයෝගීව කල්ගත කිරීමයි.

(14) පුද්ගලයා නිර්මාණය වී ඇති පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීමට දහමේ උගන්වන භාවනාව වන්නේ,

(1) බුද්ධානුස්සති භාවනාවයි. (2) ආනාපානසති භාවනාවයි.

(3) චිත්තානුස්සති භාවනාවයි. (4) විදර්ශනා භාවනාවයි.

(15) තමා උපමාකොට වරදින් වැළකී සිටීම දහමේ හැඳින්වෙන්නේ,

(1) අත්තුපනායික ධර්ම නමිනි. (2) ලෝකාධිපතෙය්‍ය නමිනි.

(3) ධම්මාධිපතෙය්‍ය නමිනි. (4) සල්ලේඛ ප්‍රතිපදාව නමිනි.

(16) බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණයට උදාහරණයකි.

(1) මට්ටකුණ්ඩලීගේ කතා පුවත. (2) අංගුලිමාලගේ කතා පුවත.

(3) සෝපාකගේ කතා පුවත. (4) රජ්ජුමාලාගේ කතා පුවත.

(17) ''දුර ගමන් යන, තනිව හැසිරෙන, ශරීරයක් නැති, ගුහාවක වෙසෙන සිත දමනය කර ගන්නා තැනැත්තා මාරයාගෙන් මිදේ. යන අදහස පැහැදිලි වන ''ධම්ම පද'' ගාථාවේ මුල් පදය වනුයේ,

(1) තංච කම්මං කතං සාධු යන්නයි. (2) උට්ඨානවතෝ සතිමතෝ යන්නයි.

(3) අචරිත්වා බ්‍රහ්මචරියං යන්නයි. (4) දූරංගමං ඒකචරං යන්නයි.

(18) ණයගැතියකු, ණය හිමිට යම් බැඳීමක් ඇති විට වහලකු මෙන් යටත් වන බව පැහැදිලි කළ ''සූත්‍රය'' වන්නේ,
(1) වසල සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) සාමඤ්ඤඵල සූත්‍රයයි. (4) අග්ගඤ්ඤ සූත්‍රයයි.

(19) තර්කානුකූලව විමසුම් සිතින් කටයුතු කරන චරිතය වන්නේ මින් කුමක් ද?
(1) රාග චරිතය. (2) බුද්ධි චරිතය.
(3) සද්ධා චරිතය. (4) විතර්ක චරිතය.

(20) මුණසිංහගේ පොඩි නෝනා මාතාවට 1897 ජූලි මස 19 වැනි දින උපන් පින්වත් කුමරා වූයේ
(1) රූබෙල් ගුණවර්ධන ය. (2) ඩේවිඩ් හේවාවිතාරණ ය.
(3) කුලතුංග බණ්ඩාර ය. (4) මද්දුම බණ්ඩාර ය.

(21) රේරුකානේ චන්දවිමල මාහිමියන් විසින් රචිත ග්‍රන්ථයක් **නොවන්නේ**,
(1) ධර්ම විනිශ්චයයි. (2) පාරමිතා ප්‍රකරණයයි.
(3) බෞද්ධයාගේ අත්පොතයි. (4) බුදුගුණ අලංකාරයයි.

(22) රට ජාතිය ආගම බේරා ගැනීමට මොලොව එළිය දුටු අනගාරික ධර්මපාල තුමාගේ උපත සිදුවූයේ,
(1) 1864 අගෝස්තු මස 17 වන දිනය. (2) 1864 සැප්තැම්බර් මස 17 වන දිනය
(3) 1865 සැප්තැම්බර් මස 18 වන දිනය. (4) 1864 ජූලි මස 16 වන දිනය.

(23) ''බෞද්ධයාගේ අත්පොත'' නමින් ප්‍රසිද්ධියට පත් ධම්මපදය සූත්‍ර ත්‍රිපිටකයේ කුමන නිකායට අයත් වේ ද?
(1) දීඝ නිකායට ය. (2) මජ්ඣිම නිකායට ය.
(3) ඛුද්දක නිකායට ය. (4) සංයුක්ත නිකායට ය.

(24) වචනයෙන් සිදු වන අකුසල් ගණයට ඇතුළත් **නොවන්නේ** මින් කවරක් ද?
(1) පිසුනාවාචා. (2) අදත්තාදාන.
(3) ඵරුසාවාචා. (4) මුසාවාදා.

(25) ''කාලා රසමුසු බෝජන කර පෙම්'' යන කවිය ඇතුළත් වන්නේ,
(1) බුදුගුණ අලංකාරයට ය. (2) සිරිත් මල්දමට ය.
(3) ලෝවැඩ සඟරාවට ය. (4) ගුත්තිල කාව්‍යයට ය.

(26) ව්‍යග්සපජ්ජ සූත්‍රයේ මෙලොව දියුණුවට දේශිත කරුණු සතර වන්නේ,
(1) සද්ධා සීල, සමාධි, ප්‍රඥා යනුවෙනි.
(2) පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනුවෙනි.
(3) වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනුවෙනි.
(4) උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා යනුවෙනි.

(27) පුද්ගල දියුණුවට හේතු වන කරුණු මහා මංගල සූත්‍රයේ දේශනා කර ඇත. එහි ඇතුළත් කරුණු ප්‍රමාණය
(1) 32 කි. (2) 38 කි.
(3) 35 කි. (4) 28 කි.

(28) පුද්ගලයාගේ පිරිහීමට හේතු කවරේ දැයි දෙවියෙකු ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් බුදුරදුන් දේශිත සූත්‍රය නම්,
(1) මංගල සූත්‍රයයි. (2) ව්‍යග්සපජ්ජ සූත්‍රයයි.
(3) පරාභව සූත්‍රයයි. (4) වසල සූත්‍රයයි.

(29) ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම.
(1) තුන්තරා බෝධිය නම් වේ. (2) භක්තිය නම් වේ.
(3) අවෙච්චප්පසාදය නම් වේ. (4) අමූලික ශ්‍රද්ධාව නම් වේ.

(30) බුදුරජාණන් වහන්සේ සමඟ එකට සිටිමින් උන් වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළ තරුණයා වූයේ,
(1) බ්‍රහ්මායු නම් කරුණයා ය. (2) තෝදෙය්‍ය නම් තරුණයා ය.
(3) සුභ නම් තරුණයා ය. (4) සිගාල නම් තරුණයා ය.

(31) නිවන් මඟට පිවිසෙන පුද්ගලයෙකු විසින් අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙළ සහිත වරණය තෝරන්න.
(1) සීල, සමාධි, සද්ධා, ප්‍රඥා (2) සද්ධා, සීල, සමාධි, ප්‍රඥා
(3) ප්‍රඥා, සමාධි, සද්ධා, සීල (4) සමාධි, සද්ධා, සීල, ප්‍රඥා

(32) සප්ත අපරිහාණීය ධර්මවලට ඇතුළත් නොවන්නේ,
(1) නිතර නිතර රැස්වීම. (2) කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.
(3) පෙර නොපැන වූ නීති පැනවීම. (4) සමඟිව රැස්ව, සමඟිව සාකච්ඡා කොට සමඟිව විසිර යාම.

(33) නව අරහාදී බුදුගුණවල ''අරහං ගුණය'' තේමා කර ගනිමින් රචනා කළ ග්‍රන්ථය වූයේ,
(1) අමාවතුර ය. (2) බුත් සරණ ය.
(3) සද්ධර්මරත්නාවලිය ය. (4) පූජාවලිය ය.

(34) ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. ''දිය බුබුලක හැඩය'' ගනිමින් නිර්මාණය කළ ස්තූප වර්ගය හඳුන්වන්නේ,
(1) බුබ්බුලාකාර ලෙස ය. (2) පද්මාකාර ලෙසය.
(3) ආමලකාර ලෙස ය. (4) ඝටාකාර ලෙස ය.

(35) බුදුදහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට පසු කාලයේ දී දැනුම ලබාදීම පිණිස එංගලන්තයේ පාලි පොත් සමාගම පිහිටුවීමට පුරෝගාමී වූයේ,
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසිනි. (2) රීස් ඩේවිඩ්ස් පඬිතුමා විසිනි.
(3) අනගාරික ධර්මපාලතුමා විසිනි. (4) බ්ලැවැට්ස්කි මැතිනිය විසිනි.

(36) ''සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් ඉපදේවායි'' යන පැතුම ඇතිව අවසන් සුසුම් හෙලුවේ මින් කවරෙක් ද?
(1) පූජ්‍ය, රේරුකානේ චන්ද්‍රවිමල හිමි. (2) පූජ්‍ය වල්පොල රාහුල හිමි.
(3) පූජ්‍ය සිරි දේවමිත්ත හිමි. (4) පූජ්‍ය අරලිය තැන්නේ හිමි.

(37) බුදුවරයකු ලොව පහළ වන්නේ මිනිස් වර්ගයා ඉදිරියේ ඇති මහා ගැටලුව හෙළිදරව් කිරීමට ය. එම ගැටලුව වන්නේ,
(1) සසර දුක පිළිබඳ ගැටලුව ය. (2) පරලොව පිළිබඳ ගැටලුව ය.
(3) කර්මය පිළිබඳ ගැටලුව ය. (4) පංචශීලයේ ආදීනව ගැටලුව ය.

(38) ධාර්මිකව උපයා ගත් ධනයක් ඇතැයි සිතා යමෙකු සතුටක් ලබන්නේ නම් එය,
(1) අණන සුඛය නම් වේ. (2) භෝග සුඛය නම් වේ.
(3) අත්ථි සුඛය නම් වේ. (4) අනවජ්ජ සුඛය නම් වේ.

(39) දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,
(1) කිත්සිරි මෙවන් රජතුමා ය. (2) ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා ය.
(3) දුටුගැමුණු රජතුමා ය. (4) පණ්ඩුකාභය රජතුමා ය.

(40) ලංකාව බුදුදහම හඳුන්වා දීමෙන් පසු ඉදි වූ ප්‍රථම දාගැබ ලෙස සැලකෙන්නේ,
(1) ගිරිහඬු දාගැබ ය. (2) මහියංගන දාගැබ ය.
(3) කැළණිය දාගැබ ය. (4) ථූපාරාම දාගැබ ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

11 | S | II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................................ බුද්ධ ධර්මය - **II** කාලය : පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) (i) සිදුහත් කුමාරයාගේ ගුරුවරයා කවු ද?

(ii) ''චිත්තං සමේතීති සමථෝ'' මෙහි අර්ථය ලියන්න.

(iii) ත්‍රිලක්ෂණය නම් කරන්න.

(iv) තණ්හාවේ ප්‍රභේද නම් කරන්න.

(v) බුදුරජාණන් වහන්සේට ඇතෙකුගෙන් හා වඳුරකුගෙන් උවටැන් ලැබුණේ කොහේ දී ද? කී වන වස් කාලයේ දී ද?

(vi) යමෙකු අගතියෙන් අගතියට යෑම පිරිහීම පිණිස හේතු වේ. එම අගති නම් කරන්න.

(vii) බුදුරාජාණන් වහන්සේගේ ''පුරිසදම්මසාරථී'' ගුණය අලළා පොළොන්නරු යුගයේ දී ලියවුණු ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

(viii) යම් කාර්යයක් ආරම්භ කිරීමේදී ඇතිකරගත යුතු වීර්යය තුන කුමක් දැයි දක්වන්න.

(ix) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(x) පුස්තකාරූඪ සංගීතිය පැවැත්වූයේ කොහේ දී ද? එය ථෙරවාදී සංගායනා අතරින් කී වෙනි සංගීතිය ද?

(ලකුණු 2 x 10)

(02) (i) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පූර්ව දිසාව හා දක්ඛිණ දිසාව තුළ සිටින සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් එක් සමාජ කොට්ඨාශයකට කළ යුතු යුතුකම්වලින් තුනක් ලියන්න.

(iii) යුතුකම් ඉටු නොකිරීමෙන් පුද්ගල දියුණුව මෙන් ම සමාජ දියුණුව ද බිඳ වැටෙන ආකාරය, ඉහත සමාජ කොට්ඨාශයක් ඇසුරු කොට ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5)

(03) (i) ''උට්ඨානවතෝ සතිමතෝ' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එහි අර්ථය ලියන්න.

(iii) ධම්මපදය පුද්ගල ප්‍රායෝගික ජීවිතය සාර්ථක කරගැනීමට ඉවහල් වන ආකාරය පහදන්න.

(ලකුණු 2 + 3 + 5)

(04) (i) බුදුරාජාණන් වහන්සේ ගිලනුන්ට පිහිට වූ අවස්ථා දෙකක් ලියන්න.

(ii) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ''නිරෝගීකම උතුම් ලාභයයි.'' මෙසේ බුදුරජාණන් වහන්සේ පුද්ගල නිරෝගීකම රැක ගැනීම සඳහා දේශනා කළ කරුණු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5)

(05) (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

(ii) විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාරය ඒවා නම් කරන්න.

(iii) යහපත් ජීවිතයක් ගත කිරීමට සහ දෙලොව ජීවිතය සාර්ථක කරගැනීමට කුසල් අකුසල් හඳුනාගෙන ජීවත්වීම තුළින් හැකි වෙයි. විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5)

(06) (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්න නම හේතුව කුමක් ද?

(ii) එම ධර්ම සංගායනාවේ මූලිකත්වය, අනුග්‍රහය හා සහභාගී වූ පිරිස නම් කරන්න.

(iii) පළමු ධර්ම සංගායනාව බුදුදහමේ උන්නතිය වෙනුවෙන් බලපෑ ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5)

(07) පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක්</u>** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහ රජතුමා

(ii) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

(iii) ස්තූපය

(iv) සතර බ්‍රහ්ම විහරණ (ලකුණු 5 x 2)